**කොළඹ මල් පාර දේශපාලන කාර්යාලයේ අද (07) පැවැති විශේෂ මාධ්‍ය සාකච්ඡාවේදී මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පළ කල අදහස්**

මීගමුව බන්ධනාගාරයේ සිද්ධිය ඉතාමත් බරපතළ තත්ත්වයක්. ඊයේ රෑ වනවිට මරණ 26ක් වාර්තා වුණා. ඒ 26න් හතක්ම රජයේ නිලධාරීන්. ඒ කියන්නේ, බන්ධනාගාරයේ නියාමක නිලධාරීන්.

මෙය ශ්‍රී ලංකා නීතිය හා ජාත්‍යන්තර නීතිය යටතේ ඉතාමත් උග්‍ර අපරාධයක්.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය අමු අමුවේ උල්ලංඝනය වෙලා තිබෙනවා. ජාත්‍යන්තර නීතියේ ශ්‍රී ලංකාව අත්සන් කරලා තිබෙන, වගකීම භාරගන්න ජාත්‍යන්තර සම්මුති හතරකට මේ සිද්ධිය සම්පූර්ණයෙන් පටහැනියි. ජාත්‍යන්තර නීතිය, ඒ තලයේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, රැඳවියන්ට සැලකීම පිළිබඳ අවම නීති ප්‍රමිතිය, ඒක හඳුන්වා දෙන්නේ නෙල්සන් මැන්ඩෙලා නීතිය හැටියට, වධහිංසා හා කෲර ලෙස සැලකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය හා මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය. මේ සියල්ලක්ම අමු අමුවේ උල්ලංඝනය වෙලා තිබෙනවා.

මෙය ජාත්‍යන්තර තලයේ විශාල ප්‍රවෘත්තියක්. ප්‍රධාන ශීර්ෂ පාඨ හරහා ලෝකය පුරාම මේ ගැන විශේෂ අවධානයක් යොමුවෙලා තිබෙනවා. මේ ක්‍රියාදාමය ගැන හිතලා බලනවා නම්, මේ සිද්ධි මාලාව මේක ආරම්භ වුණේ පසුගිය ඉරිදා. එදා හවස වන විට මෙය එක්තරා ප්‍රමාණයකට සමනය වෙලා තිබුණා. ආයෙත් ඇවිලුණා සඳුදා උදේ. ඒ ඇවිලුණේ කොළඹ බන්ධනාගාරයේ බුද්ධි අංශයේ නිලධාරීන් කීපදෙනෙක් මීගමුවට ගිය නිසායි. කවුද ඒ තීරණය ගත්තේ? එක්තරා ප්‍රමාණයකට මේක සමනය වෙලා තියෙනකොට කවුද ඒ තීරණය ගත්තේ? ඒ ගියායින් පස්සේ කවුද අණ දුන්නේ වෙඩි තබන්න? නියෝගයක් දුන්නා වෙඩි තියන්න කියලා. මොකද ඒ සමහර මෘත ශරීරවල වෙඩි උණ්ඩ, පතුරම් තිබුණා.

දැන් අධිකරණ ඇමතිවරයා කියනවා එතුමා වගකීම භාරගන්නවායි කියලා. වගකීම භාරගන්නවා කියන්නේ එතුමා අනිවාර්යයෙන් ඒ ධුරයෙන් ඉල්ලා අස්වෙන්න ඕනේ. එහෙම නැත්නම් වගකීම කියන එකට කිසිම අර්ථයක් නැහැ. ඒක තමයි ජාත්‍යන්තරව පිළිගත් සම්ප්‍රදාය, විශේෂයෙන්ම පොදුරාජ්‍ය මණ්ඩලයේ සම්මුතිය. ඉන්දියාවේ දුම්රිය අනතුරකින් පස්සේ ඒ විෂයභාර ඇමතිවරයා ඉල්ලා අස්වුණා. එතුමාගේ වරදක් තිබුණේ නැහැ, එය අනතුරක්. හැබැයි ඒ සම්ප්‍රදායට ගරු කරමින් ඉන්දියාවේ අදාළ ඇමතිවරයා ඉල්ලා අස්වුණා.

බන්ධනාගාර කොටසින් පමණක් හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ඉල්ලා අස්වීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මොකද මේ ඔක්කොම එක අමාත්‍යාංශයක්. ඒ අමාත්‍යාංශයට ඉන්නේ එකම ලේකම්වරියක්. මේක කෑලි කෑලිවලට කඩලා, බන්ධනාගාර වගකීම්වලින් ඉවත් වෙනවා. නමුත් අධිකරණ අමාත්‍යාංශයේ වෙනත් කටයුතු සම්බන්ධයෙන් තවදුරටත් වගකීම භාරගන්නවා කියලා එහෙම විභේදනයක් දක්වලා මෙය කිරීම කිසිසේත්ම පිළිගන්න බැහැ. ඒක කිසිසේත්ම තර්කානුකූල නැහැ.

අනික අපේ රටේ මේ සම්බන්ධ පූර්ව නිදර්ශක තිබෙනවා, නිස්සංක විජයරත්න මැතිතුමා අධිකරණ ඇමතිවරයා හැටියට හිටපු කාලේ මෙහෙම සිද්ධියක් ඇතිවුණා. නමුත් එය මෙතරම් දරුණු සිද්ධියක් නෙවෙයි, එතුමා හිටියේ එංගලන්තයේ රෝගාතුරව. ලෙඩ ඇඳේ ඉඳන් නිස්සංක විජයරත්න මැතිතුමා ප්‍රකාශයක් කළා, "මේකට මම සම්පූර්ණ වගකීම භාරගන්නවා" කියලා. එතුමා හැත්තෑපම් දහස් ගණනක් ඈත හිටපු අවස්ථාවකදී පවා වගකීම බාරගෙන සිය ධූරයෙන් ඉල්ලා අස්වුණා; අමාත්‍යාංශයේ කෑල්ලකින් නෙවෙයි, සම්පූර්ණ අධිකරණ අමාත්‍යාංශයෙන්ම එතුමා ඉල්ලා අස්වුණා. ඒ විතරක් නෙවෙයි, නියෝජ්‍ය ඇමති ෂෙල්ටන් රණරාජා මැතිතුමාත් ඉල්ලා අස්වුණා. එතකොට ඒ වෙනුවට පෝල් පෙරේරා මැතිතුමාව පත් කළා අධිකරණ ඇමතිවරයා හැටියට.

විෂය භාර ඇමතිතුමා කොහොමත් කියලා තියෙනවානේ, එතුමා වගකීම භාරගන්නවා කියලා. ඒ වචනවලට ප්‍රායෝගික වැදගත්කමක් තියෙන්න ඕනෙ නම් එතුමා සම්පූර්ණ අමාත්‍යාංශයෙන්, අධිකරණ අමාත්‍යාංශ ධූරයෙන් ඉල්ලා අස්විය යුතුමයි.

මේකෙන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපය සුනෙසුන් වුණා. ඒක අපි පිළිගන්න ඕනේ. ඒ ගැන අපි ලාංකිකයන් හැටියට ඉතාමත් කණගාටු වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා සංචාරකයන් එන්න, විදේශ ආයෝජන, විදේශ වෙළඳාම, මේ සියලුම කටයුතුවලට මේකෙන් විශාල පහරක් එල්ලවනවා. ඉතින් මේක කොහෙත්ම සුළුවට ගන්න පුළුවන් දෙයක් නෙවෙයි.

නමුත් හර්ෂණ නානායක්කාර මැතිතුමා වගකීම භාර අරන් අධිකරණ අමාත්‍යාංශයේ කෑල්ලකින් නෙවෙයි, සම්පූර්ණ අමාත්‍යාංශයෙන් ඉල්ලා අස්වුණත් සම්පූර්ණ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. සියලුම පාපකර්ම එතුමාගේ කර උඩින් දාලා අනෙක් සියලු දෙනා සුදනන් වෙන්නට උත්සාහ දරනවා නම් ඒ උත්සාහය කිසිසේත් සාර්ථක වෙන්නේ නැහැ.

මෙතන තිබෙන මූලික ප්‍රශ්නය කුමක්ද? මූලික ප්‍රශ්නය තමයි අද මේ සම්පූර්ණ රජයේ අවධානය යොමුවෙලා තියෙන්නේ එක දෙයක් සම්බන්ධයෙන් පමණයි. දිවා රෑ ගත කරන්නේ ඒ සඳහා. මොකක්ද ඒ? අගවිනිසුරුකාරතුමා හා විනිසුරුකරුවන්ගේ නිල කාලය දීක් කිරීමට. මේක තමයි මේ රජයේ ප්‍රමුඛ අරමුණ වෙලා තිබෙන්නේ.

මනුෂ්‍ය ජීවිත කීයක් නැති වුණත්, බන්ධනාගාරයේ නිලධාරීන්ගේ ඉරණම කුමක් වුවත්, ඒවා ගැන කිසිම තැකීමක් නැහැ. අපි කෙළින්ම අහනවා අධිකරණ ඇමතිතුමාගෙන්, අපිට එතුමා සමග කිසිම පෞද්ගලික වෛරයක් නැහැ නමුත්, අධිකරණ ඇමතිතුමා මේ තාක් කාලෙකට මේ රටේ බන්ධනාගාර කීයකට ගියාද? ඒ බන්ධනාගාරවල තත්ත්වය හොයලා බැලුවද? අධිකරණ අමාත්‍යාංශය පමණක් නෙවෙයි, මුළු ආණ්ඩුවේම ප්‍රයත්නය අගවිනිසුරුකාරතුමාගේ ප්‍රශ්නය හා විනිසුරුකරුවන්ගේ ප්‍රශ්නය, කොහොමද මේක කරන්නේ කියන එක? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වැනි වගන්තියේ 5 වැනි උපවගන්තිය සංශෝධනය කිරීම, කොහොමද මේක කරන්නේ, මෙය කිරීම

පමණයි අද ආණ්ඩුවට අවශ්‍ය වෙලා තියෙන්නේ. වෙන කිසිම දෙයක් ගැන සැලකීමක් හෝ තැකීමක් නැහැ. මේක තමයි ප්‍රශ්නය.

එතකොට කවුද අවි පැහැර ගත්තේ? ඒවා පැහැර අරගෙන අනිත් රැඳවියන්ට ඒ ගිනිඅවි පාවිච්චි කරමින් වෙඩි තිබ්බා. එහෙම නැත්නම් කවුද වෙඩි තිබ්බේ? පොලීසියද නැත්නම් බන්ධනාගාරයේ නිලධාරීන්ද? ඒ වෙඩි තැබීම ඒ විදිහට අවශ්‍ය වුණාද? අරපරිස්සමක් ඇතිව, මනුෂ්‍ය ජීවිතවලට වැදගත්කමක් දෙමින්ද ඒ වැඩකටයුතු කළේ? එහෙම නැත්නම් අහම්බෙන් වෙඩි තිබ්බාද? දැන් මේවා සොයා බැලීමට කොමිෂන් සභාවක් පත් කරලා තිබෙනවා. නමුත් මේවා ඉතාමත් වැදගත් කරුණු.

අපිට පේන හැටියට, මීගමුව බන්ධනාගාරය තුළ තිබුණේ අරාජික තත්ත්වයක්. කාටවත් පාලනයක් නැහැ. ඇයි ඒ අරාජික තත්ත්වය ඒ විදිහට ඇතිවුණේ? එතැන බන්ධනාගාරයේ කොමසාරිස් ජෙනරාල් හැටියට හිටියේ තුෂාර උපුල්දෙණිය මැතිතුමා. එතුමාගේ වැඩ තහනම් කළා. ඒ වැඩ තහනම් කළේ අද ඊයේ නෙවෙයි, 2025 ජූනි 09 වැනිදා. එදා සිට අද දක්වා ස්ථිර පත්වීමක් නැහැ. මීගමුව බන්ධනාගාරයේ බන්ධනාගාර කොමසාරිස් හැටියට පත් කරලා ඒ වගකීම් නිශ්චිත වශයෙන් භාර ගැනීමට නිලධාරියෙක් පත් කළේ නැහැ මාස 13ක් යනකන්. මාස 13ක් ඒ තනතුර හිස්.

මේවා පාලනය කරන්න, අවශ්‍ය පියවර ගන්න, සංවේදී අවස්ථාවලදී තීරණ ගන්න වගකිවයුතු නිලධාරියෙක් මාස 13ක්, අවුරුද්දකට වඩා වැඩි කාලයක් මීගමුව බන්ධනාගාරයේ සිටියේ නැහැ. කවුද ඒකට වගකියන්නෙ?

ලේකම්තුමියගේ කාර්යභාරය කුමක්ද කියලා අපි සෘජුව ප්‍රශ්න කරනවා. අයේෂා ජිනසේන, අමාත්‍යාංශයේ ලේකම්තුමිය. තුෂාර උපුල්දෙණිය මානව හිමිකම් කොමිසමට ගියා. එතුමා විධිමත් පැමිණිල්ලක් කළා. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මේ පිළිබඳව බොහොම පැහැදිලි තීන්දුවක් දුන්නා: "මේ නිලධාරියා මේ විදිහට ඉවත් කිරීමට සාධාරණ හේතු තිබුණේ නැහැ. එම නිසා කොමිෂන් සභාව ඉතාමත් පැහැදිලි නියෝගයක් දුන්නා ආපහු පත් කරන්න, ඒ වැඩ ඒ නිලධාරියාට භාරදෙන්න" කියලා. අයේෂා ජිනසේන ලේකම්තුමිය ඉතාමත් උද්ධච්ච විදිහට, අත්තනෝමතික විදිහට, කිසිම නීතිමය පදනමකින් තොරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඒ නියෝගය ක්‍රියාත්මක කළේ නැහැ; එය ප්‍රතික්ෂේප කළා.

එහෙනම් ඇයි මානව හිමිකම් කොමිෂන් සභාවක් තියෙන්නේ? ඇයි ඒකට පාර්ලිමේන්තුව මුදල් වෙන් කරන්නේ? අයේෂා ජිනසේන මහත්මියට පුළුවන් නම් ඒක කුණුකූඩයට දාන්න, සත පහක වටිනාකමක් ඒකට දෙන්නේ නැතුව එතුමියට ඕන විදිහට, දැන් කියනවානේ හැමෝම නීතියට යටත් කියලා, අයේෂා ජිනසේන නීතියට යටත්ද, එයා නීතියට උඩින්ද ඉන්නේ? එයාට මොකක්ද තියෙන අයිතිය මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝගය මේ විදිහට ප්‍රතික්ෂේප කරන්න?

මාස 13 ක් මීගමුවේ බන්ධනාගාරයේ කොමසාරිස් ජනරාල් තනතුර හිස්ව තිබුණා නම්, මෙහෙම දේවල් සිදුවීම පුදුමයට කරුණක්ද?

සියලු පාපකර්ම හර්ෂණ නානායක්කාර මැතිතුමාගේ කර උඩ දාලා ලේකම්තුමියට ගැලවෙන්න පුළුවන්ද? මම කියනවා, බොහොම පැහැදිලිව ලේකම්තුමිය මේවාට උත්තර දිය යුතුයි. එතුමියගේ හැසිරීම, එතුමියගේ ක්‍රියාපටිපාටිය ගැන එතුමිය බොහොම පැහැදිලිව, එතුමියත් වගකීම භාර අරගෙන, ඇමතිවරයා පමණක් නෙවෙයි, ඇමතිවරයාගේ මුවාවෙන්, ඇමතිවරයාට පිටුපස හැංගිලා එතුමියට බේරෙන්න බැහැ. එතුමිය බොහොම පැහැදිලිව උත්තර දීමට බැඳී සිටිනවා.

ඇයි මේවා සිදුවන්නේ? බන්ධනාගාරයේ පමණක් නොවෙයි, රජයේ සියලුම ආයතනවල වගකිවයුතු තනතුරුවලට පත් කරන්නේ සුදුසු පුද්ගලයන් නෙවෙයි. භාවිතා කරන මිනුම්දණ්ඩ පිළිබඳව තමයි මූලික ප්‍රශ්නයක් තියෙන්නේ. මේවා හරි සංවේදී තනතුරු. මේ බන්ධනාගාරය පාලනය කිරීම කියන්නේ ළදරු පාසලක් පාලනය කරනවා වගේ නෙවෙයි. ඒකට සුදුසු පුද්ගලයන් තෝරලා බේරලා පත් කරන්න ඕනේ. හැබැයි අද පත් කරන්නේ කාඩර්වරු, කාඩර්කරණය නිසා තමයි මේ විදිය මහා දරුණු ප්‍රතිඵලවලට මුහුණ දීමට අපේ රටේ ජනතාවට සිදුවෙලා තියෙන්නේ.

තනතුරට පත් කරන පුද්ගලයාට තියෙන්න ඕනේ එකම සුදුසුකම කාඩර්කෙනෙකු වීම හෝ පක්ෂයට ලැදිකම නොවේ. පක්ෂයට ලැදි වීම කිසිම ප්‍රශ්නයක් නෙවෙයි, ඕනෑම ආණ්ඩුවක් කැමතියි නිලධාරීන් පත් කිරීමේදී පක්ෂයට හිතවත් අය පත් කරන්න. නමුත් ඒ තනතුර දැරීමට අවම සුදුසුකමක් හෝ තිබෙන්න ඕනේ. එහෙම කිසිම සුදුසුකමක් නැති අය පක්ෂයට ලැදිකම නිසා පමණක් පත් කරනවා නම්, අපේ රටේ ජනතාවගේ ජීවිතවලට පවා වගකියන්න බැරි තත්ත්වයක් අනිවාර්යයෙන් උද්ගත වනවා. දැන් එහෙම තත්ත්වයක් තමයි මෙතන ඇතිවෙලා තියෙන්නේ.

දැන් පත් කර තියෙනවා කොමිෂන් සභාවක්, විශ්‍රාමලත් විනිසුරුකාරවරයෙක්ගේ, ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්. දැන් එතන විනිවිදභාවයක් තියෙන්න ඕනේ. මොකක්ද මේ වුණේ? කිසිම දෙයක් හංගන්න බැහැ. මීගමුව බන්ධනාගාරයේ පමණක් නෙවෙයි, මේ රටේ සියලුම බන්ධනාගාරවල කුඩු පිළිබඳ ප්‍රශ්නය මොකක්ද? දැන් මේ අවුල, මේක සංග්‍රාමයක් දක්වා කොහොමද දික්වුණේ? මේක නවත්වන්න තිබුණා. ඇමතිවරයා හා ලේකම්තුමිය මේ පිළිබඳ අවධානයක් යොමුකරනවා නම්, මේක වැදගත් දෙයක් හැටියට සැලකුවා නම්.

ඇමතිවරයාගේ හා ලේකම්තුමියගේ එකම කාර්යභාරය අගවිනිසුරුකාරතුමා හා විනිසුරුකරුවන්ගේ කාලය දික් කිරීම පමණක් නෙවෙයි. ඒක කොහොමත් කරන්න ලේසි වෙන්නෙත් නැහැ. හැබැයි ඒ හැරෙන්න ජනතාවට වැදගත් දේවල්, මිනිස් ජීවිතවලට සෘජුව සම්බන්ධ වන දේවල් සම්බන්ධයෙන් බොහොම වැදගත් වගකීම් සම්භාරයක් අධිකරණ අමාත්‍යාංශයට පැවරෙනවා. හැබැයි ඒ ගැන සත පහක තැකීමක් නැති නිසා තමයි මෙවැනි ව්‍යසනයක් සිදු වුණේ කියලා මා ප්‍රකාශ කරන්න කැමතියි.

අද බොහොම පැහැදිලියි, මීගමුව බන්ධනාගාරය ඩෙංගු බෝවන ස්ථානයක්. ඩෙංගු පිළිබඳ පාලනය මොකක්ද? ඩෙංගු විමානයක් බන්ධනාගාරය! ඒ ඩෙංගු

වැළදිච්ච රෝගීන්ට මොනවාද දෙන්න තිබුණු ඖෂධ? අන්න ඒක ලොකු ප්‍රශ්නයක් වුණා. මොනවාද තිබුණු පහසුකම් ඒ ලෙඩුන් බලාගැනීම සඳහා?

"ක්ලීන් ශ්‍රී ලංකා" වැඩපිළිවෙළට මේ රටේ ජනතාවගේ මුදල් කෝටි 620ක් වෙන්කරලා තියෙනවා. මේ වේල් දෙකක් කන්න බැරි, මම නෙවෙයි කියන්නේ, ලෝක බැංකුව කියන්නේ, ගෝලීය ආහාර වැඩසටහන. අපේ රටේ ජීවත්වන ජනගහනයෙන් මිලියන හයකට පෝෂණදායී ආහාර වේලක් කන්න බැරි තත්ත්වයක් මේ රටේ තියෙන්නේ.

එවන් තත්ත්වයක් තුළ අපේ රටේ ජනතාවගෙන් ලබාගන්නා බදු මුදල්වලින් කෝටි 620ක් වෙන් කරලා "ක්ලීන් ශ්‍රී ලංකා" ව්‍යාපෘතිය සඳහා පුරසාරම් දෙඩෙව්වා.

රට අමතක කරලා බන්ධනාගාරය තුළ "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට පුළුවන් වුණාද?

මේ සම්බන්ධයෙන් සම්පූර්ණ සත්‍යය රටට අනාවරණය කළ යුතුයි. ඊට පස්සේ අපිට තීරණයක් ගන්න පුළුවන් මේ සම්බන්ධයෙන් ගතයුතු ප්‍රායෝගික පියවර මොනවාද කියලා.

ඒ අතර අපි ඉතාමත් පැහැදිලිව කියනවා, මේක අමතක කරන්න කාටවත් පුළුවන්කමක් නැහැ. අප මේ රටේ මහ කොමසාරිස් කාර්යාල, තානාපති කාර්යාල, නීතිය හා අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධතාවයක් තිබෙන සියලුම ජාත්‍යන්තර ආයතන, ජිනීවාහී තිබෙන මානව හිමිකම් කවුන්සිලය ඇතුළු ඒ සියලුම ආයතනවලට අපි මේ සම්බන්ධයෙන් ඉතාමත් ප්‍රබල ලෙස අපේ අදහස් ඉතාමත් ඉක්මනින් ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

**මෙහිදී අදහස් දැක්වූ එක්සත් ජාතික පක්ෂ මහලේකම් නීතිඥ තලතා අතුකෝරල මහත්මිය මෙසේ පැවසුවාය.**

අද දවසේ අප සියලු දෙනාම විශේෂයෙන්ම දේශපාලන අධිකාරියේ වැඩ කටයුතු කරන අය හැටියට බොහොම හිත කඩා වැටුණු තත්ත්වයක සහ කණගාටුවකට පත් වෙලා තමයි පසුවෙන්නේ. මම මේ අවස්ථාවේ මීගමුව බන්ධනාගාර සිද්ධියේදී ජීවිතක්ෂයට පත් වෙච්ච රැඳවියන් දහනව දෙනා සහ නිලධාරීන් හය දෙනාගේ අකල් මරණ ගැන එක්සත් ජාතික පක්ෂය හැටියට සහ ඒකාබද්ධ විපක්ෂය හැටියට ඒ අයගේ පවුල්වලට සහ ඒ අයගේ සමීපතමයින්ට කණගාටුව පළමුවෙන්ම පළ කර සිටිනවා.

2020 මහර බන්ධනාගාරය තුළ රැඳවියන් එකොළොස් දෙනෙක් ජීවිතක්ෂයට පත් වුණු වෙලාවේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා ලස්සන කතාවක් කරනවා පාර්ලිමේන්තුවේ, ඒ අදාළ අමාත්‍යවරයා වගකීම බාර අරගෙන ඉල්ලා අස්වෙන්න ඕනේ කියලා. දැන් අපේ ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා කිව්වා වගේ, මේ වගකීම බාර අරගෙන ඉල්ලා අස්වුණා විතරක් හරිද? වගකීම බාර

අරගෙන ඉල්ලා අස්වෙන ක්‍රමයක් මේ පාලන තන්ත්‍රයේ ක්‍රමයක් නම්, මම හිතනවා මේ වෙනකොට අධිකරණ ඇමතිවරයා ඉල්ලා අස්විය යුතුයි. අධිකරණ ඇමතිවරයා විතරක් ඉල්ලා අස්වෙලා හරිද? එයාව එතැනට පත් කරේ කවුද? මේ හැම කෙනෙකුටම මේ වගකීම බෙදිලා යනවා.

මේ ඉල්ලා අස්වීම ගැන අපිට ගැටලුවක් නැහැ, ලැජ්ජාවක් නැත්නම්, රඟපෑමක් නොවෙනවා නම් ඉල්ලා අස්වෙන්න. මොකද අපි දන්නවා අධිකරණ ඇමතිවරයාට රඟපෑමේ ඉතිහාසයක් තියෙනවා, චිත්‍රපට ඉතිහාසයක් තියෙනවා. ඒ හින්දා එතුමාට කැමති නම් එතුමාට ඉල්ලා අස්වෙන්න පුළුවන්. හැබැයි එතුමාට වගකීමෙන් මිදෙන්නට පුළුවන්කමක් නැහැ. දැන් අවුරුදු එකහමාරක් තිස්සේ ඉඳන් එයා කරා කියනවා, කොයි බන්ධනාගාරයටද එතුමා ගිහිල්ලා මේ රැඳවියන් ගැන, නිලධාරීන් ගැන, ඒ අයගේ පහසුකම් ගැන හොයලා බලලා තියෙන්නේ?

එතුමා විශේෂයෙන්ම මීට වැඩිය අමාත්‍යාංශයේ ආයතන පිළිබඳව ලේකම්වරියට පවරන්නේ නැතුව හොයලා බලලා තිබුණා නම් මීට වැඩිය මේ වගේ සිදුවීම් වෙන එක වළක්වා ගන්නට පුළුවන්කම තිබුණා.

එතුමා දන්නවාද මීගමුව බන්ධනාගාරයේ බුද්ධි අංශය භාරව කටයුතු කරපු නිලධාරියාව පහුගිය දවසක බූස්සට මාරු කරා කියලා? සමහර වෙලාවට එතුමාට ඒ ගැන අවබෝධයක් නැතුව ඇති. මොකද එතුමා හදිස්සියේ මේ තනතුරු බාරගත්තට, මේවා ගැන අවබෝධයකින් වැඩ කරන බවක් අපිට පෙනෙන්නට නැහැ.

මහර බන්ධනාගාර සිද්ධිය 2020 වෙච්ච එක ගැන කතා කරන්නවත්, 2012 වැලිකඩ බන්ධනාගාරයේ වෙච්ච සිද්ධිය ගැන කතා කරන්නවත් අද මේගොල්ලොන්ට අයිතියක් නැහැ. මොකද ඒගොල්ලෝ ඒවා ඔක්කොම නවත්තනවා කියලා බලයට ආපු අයනේ. ඒගොල්ලෝ ඔක්කොම නවත්තන අය නිසා ඉස්සෙල්ලා අය අස්වුණේ නැත්නම් දැන් අය ඒ සම්බන්ධයෙන් වගකීම බාර අරගෙන කටයුතු කරන්න ඕනේ කියලා මම විශ්වාස කරනවා.

මමත් අධිකරණය බාරව හිටපු අමාත්‍යවරියක් හැටියට මට හිතන්නේ ගෑණියෙක්ට තිබිච්ච හයිය නැද්ද කොහෙද මේගොල්ලොන්ට. මේකට මේ ඇල්පෙනිත්තක් තරම් දෙයක්වත් ගෙනියන්න පුළුවන්කමක් නැහැ. ඒවා පාලනය කරගන්න ඕනේ බන්ධනාගාරයට ඇතුළු වෙන්න ඉස්සෙල්ලා. අකරමණ්‍ය වෙලා තිබුණු බුද්ධි අංශය මම හැදුවා කියන එක මට බය නැතුව කියන්න පුළුවන්. බොහොම බරපතල ගණයේ අපරාධකරුවන් බූස්ස බන්ධනාගාරය හදලා එතනට දැම්මා කියලා කියන්න පුළුවන්. හැබැයි ඒ වගේම තමයි එක දවසක අඟුණකොළපැලැස්සේ වහලේ උඩට නැගලා කට්ටිය උද්ඝෝෂණය කරපුවාම ඉක්මනට මේ නඩු ටික ගන්න කියලා අපිට පුළුවන් වුණා ඒවා මර්දනය කරන්න. විශේෂයෙන්ම තුෂාර උපුල්දෙණිය මහත්මයා තමයි ඒ වැඩේට අපි යෙදෙව්වේ.

දැන් මේ සිද්ධිය වෙන්නේ පෙරේදානේ. ඔබතුමා කිව්වා හරි, හර්ෂණ නානායක්කාර ඇමතිවරයාගේ ඔළුවේ මේ දවස්වල වැඩ කරන්නේ වෙනත් දේවල්. කියන්නේ එකක්, කරන්නේ තව එකක්. අනිත් එක අපිට නම් හරි ලැජ්ජයි, මම

කිව්වේ මම හිතන්නේ ගෑනියෙක් කරපු ඒවා කරන්න බැහැයි කියලා, මට නම් හරි ලැජ්ජයි මේ වගේ මනුෂ්‍ය ඝාතන සිද්ධ වෙනකම් මේ ආණ්ඩුව, මේ ජනාධිපතිවරයා, මේ ඇමතිවරයා කිසිම වගකීමක් නැතුව වගකීම් විරහිතව වැඩ කරපු එක ගැන.

මොකද මේ හැම මනුෂ්‍ය ජීවිතයකටම ඒගොල්ලෝ වගකියන්න ඕනේ. ඉල්ලා අස්වෙලා වැඩක් නැහැ. මම දන්නේ නැහැ ඉතින් එතුමාට විරුද්ධව යම්කිසි චෝදනාවක් තිබෙනවා නම්, එය කිරීම අත්‍යවශ්‍ය වෙනවා, මොකද මේක ඉල්ලා අස්වෙලා නවතින්න පුළුවන් එකක් නෙමෙයිනේ, මනුෂ්‍ය ඝාතන 26ක්.

මේ වෙනකොට විශේෂ කාර්ය බළකායේ තුන්දෙනෙක් ඉතාම අසාධ්‍ය තත්ත්වයේ ඉන්නවා, පොලිසියේ නිලධාරියෙක් ඉතාම අසාධ්‍ය තත්ත්වයේ ඉන්නවා. ඒගොල්ලොන්ගේ ජීවිත ගැන අපි දන්නේ නැහැ. අපිට අවශ්‍ය නැහැ කිසිම විටක මේ මල මිනී මතින් දේශපාලනය කරන්න.

දැන් මෙතුමා කිව්වා එදා එක්සත් ජාතික පක්ෂ රජය කාලේ නිශ්ශංක විජයරත්න අධිකරණ ඇමතිතුමා කොහොමද අසනීප තත්ත්වයෙන් ඉඳගෙන මේවා පාලනය කරේ කියලා. එතකොට මේකේ උවමනාවක් තියෙන්න ඕනේ. මේ උවමනාවක් නැතුව සමහර වෙලාවට මේ හැමදේම හරි කියලා, දැන් බලන්න ගිය අවුරුද්දේ පොදු සමාව යටතේ අඩු ගානේ මේ වරදකරුවෙක් නොවෙච්ච මනුස්සයෙකුත් එළියට ඇරීමේ චෝදනාවට කාවද අයින් කරන්නේ? කොමසාරිස් ජනරාල්තුමාව, උපුල්දෙණිය මහත්මයාව. එතකොට උපුල්දෙණිය මහත්මයාව ඉන්ටර්ඩික්ට් කරලා ප්‍රශ්නය විසඳෙන්නේ නැහැනේ.

දැන් ඒ සම්බන්ධයෙන් මානව හිමිකම් එකෙන් දෙනවා මෙතුමාව නැවතත් සේවයේ පිහිටුවන්න මෙතැන අසාධාරණයක් වුණා කියලා. මහාචාර්යතුමා කිව්වා වගේ මොකක්ද වෙලා තියෙන්නේ අමාත්‍යාංශයේ ලේකම්තුමියට? එයා එයාගේ තනතුර රැකගන්නද උපුල්දෙණිය මහත්මයාට මේ දීපු තීන්දුව ක්‍රියාත්මක කරන්නේ නැත්තේ? වැඩ බලන කෙනෙකුට පුළුවන්ද මේවා පාලනය කරන්න?

ලංකාවේ බන්ධනාගාර 22 තුළ දැන් 35,000ක් 40,000ක් ආසන්න ප්‍රමාණයක් රැඳවියෝ ඉන්නවා. මේ අයට ප්‍රශ්න තියෙනවා, දැන් කියන්නේ මොකක්ද එක කාමරයක ඉන්න පුළුවන් ප්‍රමාණය මෙච්චරයි, ඒක ඉතින් අපි ඔක්කොමලා දන්නවානේ. මම බලාගෙන හිටියා ඊයේ පෙරේදා එක්කෙනෙක් කියනවා මේවාට හිටපු ආණ්ඩු වගකියන්න ඕන කියලා.

ඔව්, අපි ඒ වගකීමෙන් බැහැර වෙන්නේ නැහැ. අපි ඒ වගකීම බාරගන්නම්. හැබැයි ඉතින් එකක් මතක තියාගන්න, අඟුණකොළපැලැස්ස, බූස්ස වගේ බන්ධනාගාර හැදුවේ ඔය ඉඩකඩ ප්‍රශ්නය නිසා තමයි.

මට මතක විදිහට යහපාලන රජය කාලේ බන්ධනාගාරවල හිටියේ 22,000යි. දැන් 35,000කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා, ඒක කොයි රජයක් ආවත් ඒ වගකීමෙන් මිදෙන්න බැහැ. හැබැයි මේක කාරණයක් කරගන්න බැහැ මේ රැඳවියන්ගේ මරණවලට, ඒ අය අතරින් නිලධාරීන් මැරෙන එකට, මේ මිනීමැරුම්වලට මේවා

හේතු කාරණා කරගන්න බැහැ. ඩෙංගු ප්‍රශ්න මේවට හේතු කාරණා කරගන්න හදන්න එපා කියලා අපි කියනවා.

කල්ලි අතර හැමදාම ගැටුම් තියෙනවා, ඒකට තමයි බුද්ධි අංශයක් හදලා තියෙන්නේ. බුද්ධි අංශය හදලා තියෙන්නේ අවශ්‍ය තොරතුරු ගන්න මිසක් ගිහිල්ලා ඒ මිනිස්සුන්ට පහර දෙන්න නෙමෙයි. බුද්ධි අංශයේ ප්‍රධානියෙක් ඉන්නවා, හැම බන්ධනාගාරයකටම බුද්ධි අංශය යනවා, හැම බන්ධනාගාරයක් තුළම සිද්ධ වෙන දේවල් ඉන්නවා, රයිවල් ගෑජ්ස් ඉන්නවා නම් ඒගොල්ලෝ වෙන වෙන බන්ධනාගාරවලට යවනවා.

ඒගොල්ලොන්ගේ කල්ලිවල ප්‍රශ්නයක් නිසා ඒගොල්ලෝ ගහමරාගන්න තත්ත්වයකට පත් වුණේ ඇයි? මේකේ උඩක් නැහැ, මුලක් නැහැ, ඔළුවක් නැහැ. මේකේ එක එක්කෙනාට ඕනේ ඕනේ විදිහට වැඩ කෙරීගෙන යනවා. මේක සම්පූර්ණයෙන්ම රජයේ අකර්මන්‍යතාවය නිසා සිදු වූ දෙයක්, කටින් බතල හිටවන අයනේ. වැඩක් නැහැ ඒ ගැන කතා කරලා. අපි දන්නවා ඒගොල්ලෝ ආවේ ගොඩාක් දේවල් කියාගෙන, හැබැයි අද මාධ්‍යයෙන් පෙන්නනවා වැසිකිළියට මුල්ගල තියෙන එකත්, හැබැයි මේකෙදි මම මේ ඇමතිවරයාට කියන්නේ අපි දන්නවා ඔබතුමාලාට අසභ්‍ය දේවල් පාර්ලිමේන්තුවේ වුණත් කියන්න පුරුද්දක් තියෙන අය. හැබැයි කරුණාකරලා රටේ ජාතිය ඒ තැනට පත් කරන්න එපා.

එතුමා ඊයේ කියනවා, මරපු ගාණ අහපුවාම මට දැන් පැය දෙකක් විතර සෝෂල් මීඩියා එකෙන් බලන්න බැරි වුණා කියලා. රටේ කැබිනට් ඇමතිවරයෙක් සෝෂල් මීඩියා එකෙන්ද තොරතුරු ගන්නේ? මුළු අධිකරණ පද්ධතියම භාරව ඉන්න එක්කෙනා සෝෂල් මීඩියා එකෙන් තමයි තොරතුරු ගන්නේ.

මේ අයගේ කල්පනාව කොහොමද අගවිනිසුරුතුමාගේ ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ අයගේ විශ්‍රාම වයස දික් කරලා කොහොමද නැවත වතාවක් අනිත් අයව දේශපාලන පළිගැනීමට ලක් කරලා ඉන්න අපි සියලු දෙනාම ඇතුළට දාන්නේ කියන එක විතරයි.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට මේ වෙලාවේදී අඩු ගානේ මේ සම්බන්ධයෙන් කොමිෂන් පත් කරන්න පුළුවන්, අපිට විශ්වාසයක් තියෙනවා ඔය පත් කරලා තියෙන සභාපතිතුමා හිටපු විනිසුරු ප්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමා ගැන. නමුත් මේ මොන කොමිසමකින්වත් මැරිච්ච 26 දෙනාට පණ දෙන්න බැහැ.

භාණ්ඩාගාරේ ප්‍රශ්නෙට බලනහර කපාගෙන මැරෙන කණ්ඩායමක් එක්ක අධිකරණ ඇමතිතුමාට වැඩ කරන්න බැරි නම් කරුණාකරලා මේකේ වගකීම බාර අරගෙන හරියන්නේ නැහැ, මේකේ සදාචාරාත්මක තත්ත්වයටත් මුහුණ දෙන්න කියන එක තමයි අපි මේ වෙලාවේදී ඉල්ලා සිටින්නේ.

**මෙහිදී අදහස් දැක්වූ හිටපු ආණ්ඩුකාර රජිත කීර්ති තෙන්නකෝන් මහතා මෙසේ කීවේය.**

මෑත කාලීන ප්‍රවණතාවය තමයි, මේ තියෙන සීමිත හිරගෙවල්වලට අසීමිත පිරිසක් රිමාන්ඩ් කිරීම. පොලීසිය කිසිම හේතුවක් නැතිව ඇපදීමට විරුද්ධ වෙනවා.

අල්ලස් කොමිසම කිසිම හේතුවක් නැතිව අධිකරණයට ඉදිරිපත් කරන සෑම සැකකරුවෙකුටම වාගේ ඇපදීමට එරෙහි වෙනවා. රිමාන්ඩ් කිරීම දඬුවමක් ලෙස ක්‍රියාත්මක වන ලෝකයේ එකම රට ලංකාව.

ඇප ලබාදීම යනු රීතියයි, ඇප නොදී රඳවා ගැනීම ව්‍යතිරේකයයි. හැබැයි අද සිදුවන්නේ මෙහි අනිත් පැත්ත. සෑම පුද්ගලයෙකුම රිමාන්ඩ් කිරීම සාමාන්‍ය ව්‍යවහාරය බවට පසුගිය වසර දෙක තුල පත්වෙලා තියෙනවා.

අද වෙනකොට රැඳවියන්ගෙන් 73.8% ක් රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්නේ. එකෙන් පේනවා, ඇප ලබා දෙන්න පුළුවන් වැරදිවලට රිමාන්ඩ් බන්ධනාගාර පුරවලා තියෙන බව. මේක පටන්ගත්තේ දේශබන්ධු තෙන්නකෝන් ගේ කාලයේ. මේ ආණ්ඩුව ඒක දිගටම කරගෙන යනවා.

පසුගිය වසරක කාලය තුල අධිකරණ කේෂ්ත්‍රයේ, පොලිස් කේෂ්ත්‍රයේ, බන්ධනාගාර කේෂ්ත්‍රයට සිදුවී තෙයෙන ලොකුම නස්පැත්තිය තමයි කිසිම සාධාරණ හේතුවක් නැතිව ඇපදීමට විරුද්ධවීම.

අධිකරණයේ උසස්වීම් ගන්න නම් වැඩිම ප්‍රමාණයක් හිරේ දාන්න ඕනි කියන තැනකට මතයක් අධිකරණය, පොලීසිය, ආණ්ඩුවේ දේශපාලනඥයින් අතර ඇති වෙලා තියෙනවා.

පොලීසියත් හිතනවා වැඩිම පිරිසක් හිරේ දැම්මාම තමන්ට උසස්වීමක් ගන්න පුලුවන් කියලා. පොලීසිය කියන්නේ ආණ්ඩුවේ. ආණ්ඩුවට අදහසක් තිබිය යුතුයි. හිරගෙවල්වල ධාරිතාවය කුමක් ද කියලා.

ආණ්ඩුව හිරගෙවල්වල ගාල් කරන රැඳවියන් සංඛ්‍යාව උපරිමය කරන්න තීරණය කරලා තියෙනව බව ඉතා පැහැදිලියි. එහෙනම් බන්ධනාගාරවල ඉඩ වැඩි කළ යුතුයි.

ඔය සිය ගණන් වහන පාසල්ටික වත් බන්ධනාගාරබවට පත් කළ යුතුයි. ආණ්ඩුව ඉස්කොළ වහනවා. බන්ධනාගාර පුරවනවා. මේ ආණ්ඩුවේ මූලික සටන් පාඨය තමයි හොරු අල්ලනවා කියලා පුද්ගලයින් රිමාන්ඩ් කරන එක.

මිනිහෙක් අල්ලගෙන එනවා. උසාවි දානවා. ඇප දෙන්න විරුද්ධ වෙනවා. හිරේ දානවා. ඊට පස්සේ සාක්කි හොයන්න ඇප නොදී කල් ගන්නවා.

අධිකරණයත් පොලීසියක් එකතුවෙලා මිනිස්සු හිරේදාන ව්‍යාපෘතිය ඉස්සරහට ගෙනියනවා. කවුද මේ හිරේ දාන්නේ? භික්ෂූන් වහන්සේ ලා හිරේ. හමුදාව හිරේ. නාවික හමුදාව හිරේ. ගුවන් හමුදාව හිරේ. පොලීසියත් හිරේ. රාජ්‍ය නිලධාරි සිය ගානක් හිරේ. ව්‍යාපාරිකයෝ හිරේ. දේශපාලනඥයෝ හිරේ.

අනෙක් අතට, අද බන්ධනාගාර පීරී තියෙන්නේ 1984 අංක 13 දරණ විෂ අබිං සහ මත්ද්‍රව්‍ය පනතේ 54 වගන්තිය යටතේ අධිකරණයට කරුණු වාර්තා කර තියෙන අය.

අපි කියනවා 54 න් දාලා ඇප නොදී ඉන්නවා කියලා. විශ්වාස කරන්න අර හිටපු විකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ගේ කුඩු නාට්ටිය යටතේ අත්අඩංගුවට ගත්ත කුඩු දාලා ආත්අඩංගුවට ගත්ත මිනිස්සු පවා මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබාගන්නේ නැතුව ඉන්නවා.

අද බන්ධනාගාර පිරිලා ඉතිරිලා තියෙන්නේ 54 ගහලා දාපු මිනිස්සුන්ගෙන්. රස පරීක්ෂක වාර්තා නැති නිසා ඉන්න මිනිස්සුන්ගෙන්. රස පරීක්ෂක වාර්තා ආවාම තමයි දන්නේ මේවා පාන්පිටි, පැනඩොල් පෙති කුඩු දාලා තමයි මිනිස්සු මාස ගණන් ඇප නැතිව තියාගෙන ඉන්නේ කියලා.

මේ ඝාතනවලට බොරුවට 54 ගහලා ඇප දෙන්න බැරි කරපු පොලීසිය වගකියන්න ඕනි. රස පරීක්ෂක වාර්තා නැතිව මාස 3 ක් හිරේ ඉන්න 6,336 ක් ඉන්නවා. මාස 3 – 6 ඉන්න 4,904 ක් ඉන්නවා. මාස 6 -12 අතර ඉන්න 3.706 ක් ඉන්නවා. අවුරුද්දට වැඩි 728 ක් ඉන්නවා.

ජාතික ජනබලවේගය ප්‍රතිපත්ති ප්‍රකාශයේ කිව්වා රස පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමධ්‍යගත කරනවා කියලා කරලාද? නෑ. අද රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ තනතුරු 121 ක් පුරප්පාඩුයි. මේක තමයි මේ තදබදයට හේතුව. රස පරීක්ෂකලා බදවා ගන්නේ නැතුව අධිකරණ ඇමති බයිලා කියලවා.

අච්චු සිරකරුවන්ට බන්ධනාගාර හදනවා කිව්වා. හැදුවද? නෑ. මැතිවරණ පොරොන්දු කිසිවක් ඉටු කරන්නේ නෑ. ඒ වෙනුවට, වැඩිම පිරිසක් කිසිම සාධාරණ හේතුවක් නැතිව හිරේ දාලා මාධ්‍ය සංදර්ශන දානවා.

අද වැරදිකරුවෝ වෙලා ඉන්න 43%ක් දඩ ගෙවාගන්න බැරුව හිරේ ඉන්නේ. අන්ත අසරණ දුප්පත් මිනිස්සු. අධිකරණ ඇමතිවරයා හදිසියකට හොයා ගන්න බෑ. මොකවත් දන්නේ නෑ. එයා මරණ ගාන හොයාගන්නේ සමාජ මාධ්‍ය වලින්. එයා දැන් සතියක් අගවිනිසුරුගේ කාලය දීර්ඝ කරන්න විශ්‍රාමලත් විනිසුරුවන් සමඟ කුමන්ත්‍රණය කරනවා. ඇමතිට බන්ධනාගාර ගැන බලවන්න වෙළාවක් නෑ. එයාගේ සිහින ව්‍යාපෘතිය විනිසුරුවන්ගේ සේවා කාලය දීර්ඝ කරලා, අගවිනිසුරු වැඩිම කාලයක් තනතුරේ තබා ගැනීම.

අධිකරණ ඇමති දැන් කියනවා, වගකීම බාරගන්නවා කියලා. ඇමතිට වගවීමක් නැද්ද? වගවීමක් තියෙනවා නම්, ඔහු වහාම ඉල්ලා අස්විය යුතුයි.

තත්වය පාලනය කරපු හිරගෙදරයක් ජූලි 6 වෙනිදා උදේ තිබුණේ. කාගේ හෝ මැදිහත්වීමකින් බන්ධනාගාර බුද්ධි අංශ කියලා 30 ක කණ්ඩායමක් ඒයේ උදේ මීගමුවට එව්වා. ඒ අය තමයි මැදට පැනලා කලබල කළේ. ඒ අයගෙන් පිරිසක් තමයි ඝාතනයට ලක් වුණේ. ඒ ආපු 30 න් 22 ක් තුවාල ලබලා තියෙනවා. සිවිල් ඇඳුමෙන් ගිහින් තමයි මේ ඝාතන වැලට හේතු වූ සිද්ධිය ඇතිකරගෙන තියෙන්නේ.

**මෙම මාධ්‍ය සාකච්ඡාවේදී සමගි ජන සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ දයාසිරි ජයසේකර, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජ්‍ය ලේකම් ආචාර්ය සුරේන් රාඝවන් යන මහත්වරු ද අදහස් දැක්වූහ.**